# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2012 අංක 13 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2012 මැයි මස 04 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2012 මැයි මස 04 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 5.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 10.00 යි.

## 2012 අංක 13 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2012 මැයි මස 04 වන දින]

එල්.ඩී.—ඕ. 41/2010.

### 2008 අංක 5 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2012 අංක 13 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 2008 අංක 5 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය පනතේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 2008 අංක 5 දරන පනතේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (3) සහ (4) වන උපවගන්ති ඉවත් කිරීමෙන් ;

(2) (5) සහ (6) වන උපවගන්ති (3) සහ (4) වන උපවගන්ති ලෙස නැවත අංක කිරීමෙන් ;

(3) එම වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"විනය නීති සංග්‍රහය සහ එය අදාළ වීම"

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 17අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තිය ඇතුළත් කිරීම.

"මාණ්ඩලික විද්‍යාලයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ සහ සිවිල් කාර්ය මණ්ඩලයේ විනය පාලනය කිරීම.

17අ. (1) මාණ්ඩලික විද්‍යාලයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ විනය පාලනය මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායකවරයා විසින් හෝ සේනාවිධායකවරයා විසින් තත්කාර්ය සඳහා බලය ලබා දුන් මාණ්ඩලික විද්‍යාලයේ වෙනත් යම් නිලධරයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) මාණ්ඩලික විද්‍යාලයේ සිවිල් කාර්ය මණ්ඩලයේ විනය පාලනය කිරීම මණ්ඩලය විසින් සාදන ලද රීති මගින් නිශ්චිතව දක්වා ඇති කාර්ය පටිපාටියට අනුව මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායකවරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සම්බන්ධයෙන් අදාළ කරගනු ලබන කාර්ය පටිපාටියට අනුව පත් කර ගනු ලැබිය යුතු සිවිල් පරිපාලන නිලධරයකු සිටිය යුතු ය. එම තැනැත්තාගේ පත් කිරීම වසර පහක කාලයක් සඳහා විය යුතු ය. සිවිල් කාර්ය මණ්ඩලයේ යථා පරිපාලනිය පිළිබඳව සිවිල් පරිපාලන නිලධරයා විසින් සේනාවිධායකවරයාට වගකිව යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''(2) ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයට අයත්වන සුදුසුකම් ලත් විගණකවරයකු මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු අතර, එම විගණකවරයා, සේනාවිධායකවරයාගේ විධානය යටතේ මාණ්ඩලික විද්‍යාලයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් වගකිව යුතු ය. මාණ්ඩලික විද්‍යාලයේ ගිණුම් විගණනය සඳහා රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ කර ගනු ලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''(2) මාණ්ඩලික විද්‍යාලයේ ගණකාධිකාරීවරයා මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු අතර, එම ගණකාධිකාරීවරයා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට අයත් විය යුතු ය. සේනාවිධායකවරයාගේ විධානයට යටත්ව ඇස්තමේන්තු සකස් කිරීම සහ මාණ්ඩලික විද්‍යාලයේ පරිපාලනය හා සම්බන්ධ සියලු මූල්‍ය කරුණු පිළිබඳව ගණකාධිකාරීවරයා වගකිව යුතු ය.''.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියට 25අ වගන්තිය ඇතුළත් කිරීම.

"මාණ්ඩලික විද්‍යාලයේ සිවිල් කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත්කිරීම.

25අ. මණ්ඩලයේ ඉල්ලීමකට අනුව, යම් රජයේ නිලධරයකු එම නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කළ හැකි ය. නැතිනම් එවැනිම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු මාණ්ඩලික විද්‍යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, එම නිලධරයාට සහ එම නිලධරයා සම්බන්ධයෙන් 1991 අංක 37 දරන ජාතික ප්‍රවාහන කොමිෂන් සභාවේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු මාණ්ඩලික විද්‍යාලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක දී, එම නිලධරයාට සහ එම නිලධරයා සම්බන්ධයෙන් 1991 අංක 37 දරන ජාතික ප්‍රවාහන කොමිෂන් සභාවේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලයක් රජයට සේවය කිරීම සඳහා එකඟවෙමින් රජය සමග යම් ගිවිසුමකට එළඹී ඇති තැනැත්තකු කාර්ය මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක දී, එම තැනැත්තා විසින් මාණ්ඩලික විද්‍යාලයට කරනු ලබන යම් සේවා කාලයක් එම කොන්ත්‍රාත්තුව යටතේ වූ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා එම තැනැත්තා විසින් රජයට කරනු ලබන සේවා කාලයක් ලෙස සළකනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ ඉල්ලීම පරිදි, අවස්ථාවෝචිත පරිදි මාණ්ඩලික ආයතනයේ සහ පළාත් රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය හෝ පළාත් පාලන ආයතනය විසින් එකඟ විය හැකි විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් හිමිකම් ඇතුළුව යම් නියම සහ කොන්දේසි මත, පළාත් රාජ්‍ය සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක නිලධරයකු සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවා නියුක්තිකයාගේ එකඟත්වය ඇතිව මාණ්ඩලික විද්‍යාලය විසින් තීරණය කරනු ලබන යම් කාලයක් සඳහා මාණ්ඩලික විද්‍යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කිරීම හෝ එවැනිම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කිරීම කරනු ලැබිය හැකි ය.

(6) මෙම වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ මාණ්ඩලික විද්‍යාලයේ කාර්ය මණ්ඩලයට යම් තැනැත්තකු තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, එම තැනැත්තා කාර්ය මණ්ඩලයේ වෙනත් යම් තැනැත්තකු සම්බන්ධයෙන් වූ විනයානුකූලව ක්‍රියා කිරීමේ ක්‍රමයට යටත් විය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.